C
371

# ද්විතීය පාඨශාලීය ශිෂ්‍යාවන් අතර පවතින සිංහල භාෂාවේ ප්‍රජානන කැමති ශෛලීන් පිළිබඳ අධ්‍යයනයක්.

පී.අයි.වී. අපොන්සු
(ඉන්ද්‍රාණි තුරුණානායක)
ශාස්ත්‍රවේදී- විශේෂ (ලංකා), අධ්‍යාපන ඩිප්ලෝමා (ලංකා)

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

382207

පේරාදෙණිය විශ්ව විද්‍යාලයීය තලා පීඨයේ අධ්‍යාපන ශාස්ත්‍රපති උපාධිය සම්බන්ධ අවශ්‍යතා අර්ධ වශයෙන් පූරණය කිරීම සඳහා ඉදිරිපත් කරන පර්යේෂණාත්මක නිබන්ධනයෙකි.

1981

 iii

# සා රා ං ශ ය

ඉහත වකවානුවල, සර්වවර්තීව පැවතුණ බුද්ධිඵලය පිළිබඳ සංකල්පයට අමතරව, ශිෂ්‍යයන්ගේ ප්‍රජානන ශෛලීන් හා පාඨශාලීය විෂය ක්ෂේත්‍රයන් ආශ්‍රිතව ප්‍රජානන කැමති ශෛලීන් පිළිබඳව විමසා වඩා සාර්ථකවූත්, ක්‍රමවත් වූත් මාර්ගයන් ඔස්සේ අධ්‍යයනය සකස් කිරීමට නූතන අධ්‍යාපන මනෝවිද්‍යාඥයන් බෙහෙවින් උත්සුක වන බව පෙනේ.

මෙම අධ්‍යයනය සිංහල භාෂා විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අ.පො.ස. (සා.පෙළ) ශිෂ්‍යාවන් 300 ක් දෙනා දැක් වූ ප්‍රජානන කැමති ශෛලීන් විමසීම පිණිස කරන ලද්දකි.

මෙම අධ්‍යයනයෙහිදී පළමුව පුද්ගලගත විවිධතා පිළිබඳව 19 වැනි ශත වර්ෂයේ අග භාගයෙහිදී, අධ්‍යාපන මනෝවිද්‍යාඥයන් විසින් කරන ලද අධ්‍යයනයන්ද, ඉන්පසු 20 වැනි ශතවර්ෂයේ මුල් භාගයේදී පමණ ප්‍රජානන ශෛලීන් විමසීම පිණිස කරන ලද අධ්‍යයනයන්ද, අනතුරුව, පාඨශාලීය විෂය ක්ෂේත්‍රයන් හා බැඳි ප්‍රජානන කැමති ශෛලීන් පිළිබඳවද විමසන ලදී. ප්‍රධාන වශයෙන් මෙහි, කල්පිත හතරක් පරීක්ෂා කෙරිනි. පළමුව, භාෂා සංරචක අංග හතරක් සේ මෙහිදී තෝරා ගන්නා ලද, **අවබෝධකරණය, රචනාකරණය, සාරාංශකරණය හා ව්‍යාකරණය** යන අංග කෙරෙහි ශිෂ්‍යාවන් දක්වන ප්‍රජානන කැමැත්තෙහි පෞද්ගලික වෙනස්කම් තිබේ දැයි සොයා බලන ලදී. කිසියම් භාෂා සංරචක අංගයකට දක්වන ප්‍රජානන කැමති ශෛලිය හා එම අංගය සම්බන්ධයෙන් දක්වනු ලබන කැරුම්සාරිය හා සම්බන්ධකමක් පවතීදැයි විමසා බලන ලදී. සොයා ගැනීම් අනුව, කිසියම් භාෂීය අංගයක් කෙරේ දක්වන ප්‍රජානන කැමති ශෛලිය හා එම අංග කෙරෙහි ඇති හැකියාව එකකට එකක් සම්බන්ධ නැති සාධක දෙකක් බව අනාවරණය විය. තවද, ප්‍රජානන කැමති ශෛලීන් හි පවතින වෙනස්කම් සිංහළ භාෂා ශාස්ත්‍රයෙහි ප්‍රතිඵල නිර්ණය කෙරෙන්නෙකැයි යන උපකල්පිතය පරීක්ෂා කිරීමේදී මතු වුණ කරුණකි අවබෝධකරණය හා රචනාකරණය යන අංග දෙක කෙරෙහි ඉහළ ප්‍රජානන කැමැත්තක් දැක්වූ ශිෂ්‍යාවන් භාෂා ශාස්ත්‍රය

iv

සම්බන්ධයෙන් ඉහළ සාධනයක් ලබා ගත් බව. මෙම අධ්‍යයනයට මුල් වුණු, ආර්.එෆ්. කෙම්පා සහ ජී.ඊ. ඩුබෙ විසින් කරන ලද ' Cognitive Preference Orientations in Students of Chemistry ( 1973 ) යන අධ්‍යයනයෙන් දක්වා ඇති නිගමනයක් වන ප්‍රජානන කැමති ශෛලිය හා සාධනය අතර සම්බන්ධයක් ඇතැයි යන්න මෙම අධ්‍යයනය තුළින්ද සනාථ විය.

එසේම, මෙම පර්යේෂණය තුළින් භාෂා ශාස්ත්‍රයෙහි සංරචක අංග හතරක් ඔස්සේ ඒ ඒ ප්‍රජානන කැමති ශෛලීන්හි දියානතියද විමසනු ලැබිය. මේ සම්බන්ධයෙන් සාධක විශ්ලේෂණයක් කිරීම අභිප්‍රාය වුවත්, ඒ සම්බන්ධයෙන් ගත් වෑයම් සියල්ලම ව්‍යර්ථ වූ බැවින්, සහසම්බන්ධන සංගුණකය විමසීමෙන් ලැබූ ප්‍රතිඵල පමණක් මේ සඳහා උපයෝගී කරගනු ලැබිය. ප්‍රතිඵල විමසන විට පෙනී ගියේ එකිනෙක හා පවතින සහසම්බන්ධනය දුර්වල හෙයින් මෙම සංරචක අංග එකිනෙක අතර හරස් බල-පෑමක් නැති බවත් ය. කෙසේ වෙතත්, අවබෝධකරණ හා රචනාකරණ ප්‍රජානන කැමති ශෛලිය එක් ධ්‍රැවයකත්, ව්‍යාකරණ හා සාරාංශකරණය සඳහා වූ ප්‍රජානන කැමති ශෛලිය අනෙක් ධ්‍රැවයෙහිත් පවතින බව අනාවරණය විය.

ප්‍රජානන කැමති ශෛලීන් විමසා, ඒවාට අනුකූල වන පරිදි ඉගැන්වීම් කාර්යයන් හැඩගැස්විය යුත්තේ කෙසේ ද? ශිෂ්‍යයකුගේ ප්‍රජානන කැමති ශෛලීන් ඔස්සේ අධ්‍යාපන කටයුතු මෙහෙයවිය යුතු ද? එය කෙසේ කළ යුතු ද? යනාදී ප්‍රශ්න විමසීම පිණිස තවදුරටත් පර්යේෂණ රාශියක් කළ යුතු බව හැඟේ.

: : :